# විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය

## ශ්‍රී ලංකා
## ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
## සංශෝධනය කිරීම සඳහා වූ
## කෙටුම්පතකි

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

2. (මෙහි මින්මතු "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 වන ව්‍යවස්ථාව සංශෝධන කිරීම

(i) 4 වන ව්‍යවස්ථාවේ (ආ) ඡේදයේ "ජනතාව විසින් තෝරා පත් කර ගනු ලබන ජනරජයේ ජනාධිපතිවරයා විසින් ක්‍රියාත්මක කළ යුත්තේ ය." යන වචන වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට ජනාධිපතිවරයා සහ කැබිනට් අමාත්‍ය මණ්ඩලය විසින් ක්‍රියාත්මක කළ යුත්තේ ය." යන වචන ආදේශ කිරීමෙන්;

(ii) 4 වන ව්‍යවස්ථාවේ (ඉ) ඡේදයේ "ජනරජයේ ජනාධිපතිවරයා තෝරාපත් කිරිමේ ඡන්ද විමසීමක දී" යන වචන ඉවත් කිරීමෙන්.

3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 30 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ:- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 30 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

(i) 30 වන ව්‍යවස්ථාවේ (1) ඡේදයේ "ආණ්ඩුවේ ප්‍රධානියා ද" යන වචන ඉවත් කර එම 30 වන ව්‍යවස්ථාවේ (1) වන ඡේදය අවසානයට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව ක්‍රියාකරනු ලැබිය යුතු වූ" යන වචන ආදේශ කිරීමෙන්;

(ii) 30 වන ව්‍යවස්ථාවේ (2) ඡේදයේ "ජනතාව විසින් තෝරාපත් කරගනු ලැබිය" යන වචන වෙනුවට

"පාර්ලිමේන්තුව විසින් මේ ව්‍යවස්ථාවේ (3) වන ඡේදයේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට තෝරා පත් කර ගත" යන වචන ආදේශ කිරීමෙන්;

(iii) 30 වන ව්‍යවස්ථාවේ (2) වන ඡේදයේ "පස් අවුරුදු කාලයක්" යන වචනවලට පෙරාතුව "සාමාන්‍යයෙන්" යන වචන ඇතුලත් කිරීමෙන්;

(iv) 30 වන ව්‍යවස්ථාවේ (2) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අතුරු විධාන ඇතුළත් කිරීමෙන්:

"එසේ වුව ද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මීට පටහැණිව කුමක් වුව ද, ජනාධිපතිවරයා වශයෙන් එසේ තෝරා පත් කර ගනු ලබන තැනැත්තා, තමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව කලින් ධුරය දැරීම අවසන් වන්නේ නම් මිස, ඊළඟ පාර්ලිමේන්තුව විසින් ජනාධිපතිවරයකු තෝරා පත් කරනු ලබන තෙක් අඛණ්ඩව ධුරය දරනු ලැබිය යුත්තේ ය.

එසේම තවදුරටත්, ස්වකීය තෝරා පත් කිරීමේ දින සිට අවුරුදු පහක කාලසීමාවක් අවසන් වී නොතිබීම පිළිබඳ කරුනු නොසලකා ඊළඟ පාර්ලිමේන්තුව විසින් ජනාධිපතිවරයකු තෝරා පත් කරනු ලැබීම සමඟම එවැනි තැනැත්තකු විසින් ධුරය දැරීම අවසන් වන්නේය.

(v) 30 වන ව්‍යවස්ථාවේ (3) (4) සහ (5) වන ඡේද වශයෙන් බලාත්මක විය යුතු 30 වන ව්‍යවස්ථාවේ (2) වන ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන්:-

"(3) 88 වන ව්‍යවස්ථාව යටතේ සුදුසුකම් ලබා ඇති සහ 89 හෝ 92 ව්‍යවස්ථා යටතේ නුසුදුස්සකු වී නොමැති යම් පුරවැසියකු පාර්ලිමේන්තුව විසින් නීතිය මගින් විධිවිධාන සලස්වනු ලබන කාර්ය පටිපාටිය ප්‍රකාරව රහසිගත ඡන්දය මඟින් පාර්ලිමේන්තුවේ පළමු සැසිවාරයේ සිට සති හතරක කාලයක් ඇතුළත (පැමිණ නොසිටින මන්ත්‍රීවරුන්ද ඇතුළුව) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සාමාන්‍ය බහුතර ඡන්දයෙන් තෝරාපත් කර ගනු ලැබිය යුතුය.

(4) මියයෑම, ඉල්ලා අස්වීම, ධුරයෙන් ඉවත් කිරීම හෝ අන්‍යාකාරයෙන් ජනාධිපති ධුරයේ පුරප්පාඩුවක් ඇතිවන අවස්ථාවක දී, එම පුරප්පාඩුව පිරවීම සඳහා මේ ව්‍යවස්ථාවේ (3) වන ඡේදය ප්‍රකාරව පුරප්පාඩුව ඇති වී සති හතරකට වඩා වැඩි නොවන කාලයක් තුළ දී ඡන්ද විමසීමක් පවත්වනු ලැබිය යුතු ය. එම පුරප්පාඩුව පිරවීම සඳහා තෝරා පත් කර ගනු ලබන තැනැත්තා ඉතිරි ධුර කාලය සඳහා ධුරය දරනු ලැබිය යුතු ය.

එසේ වුවද, පාර්ලිමේන්තුව විසුරුවා හැරීමෙන් පසුව ජනාධිපති ධුරය හිස්වන අවස්ථාවකදී, ඉහත කී ආකාරයට ජනාධිපතිවරයකු තෝරාපත් කිරීමේ පරම කාර්යය සඳහාම එම පුරප්පාඩුව ඇතිවී සති එකක කාලයක් ඇතුලත කථානායකවරයා විසින් පාර්ලිමේන්තුව කැඳවනු ලැබිය යුතුය.

(5) ජනාධිපතිවරයා වශයෙන් තෝරා පත් කරගනු ලබන තැනැත්තකු තමා ජනාධිපතිවරයා වශයෙන් ධුරය දරන තාක් දුරට යම් දේශපාලන පක්ෂයක ධුර දැරීම හෝ සාමාජිකයකු වීම සිදු නොකළ යුතු ය.

4. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31 වන ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31 වන ව්‍යවස්ථාව ඉවත් කිරීම

5. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ :-

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

(i) එහි (2) වන ඡේදයේ (අ) උපඡේදය ඉවත් කිරීමෙන්;

(ii) එහි (2) වන ඡේදයේ (ඇ) උපඡේදයේ "වාර අවසන් කිරීමට" යන වචනය ඉවත් කිරීමෙන්;

(iii) එහි (2) වන ඡේදයේ (ඇ) උපඡේදය ආරම්භයට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට" යන වචන එකතු කිරීමෙන්;

(iv) එම ව්‍යවස්ථාවේ 2 වන ඡේදය අවසානයට පහත දැක්වෙන අතුරු විධානය එකතු කිරීමෙන් :

"එසේ වුව ද, තනාපතිවරුන්, මහකොමසාරිස්වරුන්, නිල නියෝජිතයන් සහ වෙනත් විදේශ දූත නියෝජිතයන් පත් කිරීමේ දී සහ බලය පැවරීමේ දී ජනාධිපතිවරයා වෙත අග්‍රාමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරනු ලබන කැබිනට් අමාත්‍ය මණ්ඩලයේ උපදෙස් අනුව ක්‍රියා කරනු ලැබිය යුතු ය."

6. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

(අ) එහි (1) වන ඡේදයේ "(1) ශ්‍රී ලංකා ජනරජයේ කවර වූ හෝ අධිකරණයක දී වරදකරු කරන ලද කවර වූ හෝ වරදකරුවකුට" යන වචනවලට ඉක්බිතිව ම "ජනාධිපතිවරයාගේ නිර්දේශ කැබිනට් මණ්ඩලය විසින් අනුමත කිරීමට යටත්ව" යන වචන එකතු කිරීමෙන්;

(ආ) එහි (2) වන ඡේදයේ "යම් කිසි තැනැත්තකු සම්බන්ධයෙන්" යන වචනවලට ඉක්බිතිවම "ජනාධිපතිවරයාගේ නිර්දේශ කැබිනට් මණ්ඩලය විසින් අනුමත කිරීමට යටත්ව" යන වචන එකතු කිරීමෙන්;

(ඇ) එහි (3) වන ඡේදයේ "සමාවක් දීමට" යන වචනයට ඉක්බිතිව ම "ජනාධිපතිවරයාගේ නිර්දේශ කැබිනට් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කිරීමට යටත්ව" යන වචන එකතු කිරීමෙන්.

7. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 35 වන ව්‍යවස්ථාවේ (3) වන අනුව්‍යවස්ථාවේ "ජනාධිපතිවරයා තෝරාපත්කර ගැනීමේ ඡන්ද විමසීම හා සම්බන්ධව හෝ" යන වචන ඉවත් කිරීමෙන් එම ව්‍යවස්ථාව මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 35 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

8. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 37 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 37 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

(අ) (1)වන අනුව්‍යවස්ථාවේ "අග්‍රාමාත්‍යවරයා පත්කළ හැක්කේය" යන වචන ඉවත්කර ඒ වෙනුවට "කථානාකවරයා පත්කළ හැක්කේය" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) (1)වන අනුව්‍යවස්ථාවේ "තවද එම කාලසීමාව තුළ අග්‍රාමාත්‍ය ධුරයේ වැඩ බැලීම පිණිස ජනාධිපතිවරයා විසින් අමාත්‍ය මණ්ඩලයේ වෙනත් අමාත්‍යවරයකු පත්කළ හැක්කේය" යන වචන ඉවත් කිරීමෙන්;

(ඇ) (1)වන අනුව්‍යවස්ථාවේ අතුරු විධානය ඉවත් කිරීමෙන්;

(ඈ) (2)වන අනුව්‍යවස්ථාවේ "කථානායකවරයා විමසීමෙන් පසුව" යන වචන ඉවත්කර ඒ වෙනුවට "අග්‍රාමාත්‍යවරයා විමසීමෙන් පසුව" යන වචන ආදේශ කිරීමෙන්;

(ඉ) (2)වන අනුව්‍යවස්ථාවේ

"කථානායකවරයා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුත්තේය. එවිට අග්‍රාමාත්‍යවරයා" යන වචන ඉවත්කර ඒ වෙනුවට "අග්‍රාමාත්‍යවරයා වෙත ලියවිල්ලකින් දැනුම්දිය යුත්තේය. එවිට කථානායකවරයා" යන වචන ආදේශ කිරීමෙන්;

(ඊ) (2)වන අනුව්‍යවස්ථාවේ "තවද, මෙම ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ විධිවිධාන සලස්වා ඇති පරිදි පත්කිරීමක් කරනු නොලැබ තිබුණද, එම කාලසීමාව තුළ අග්‍රාමාත්‍ය ධුරයේ වැඩ බැලීම පිණිස ඔහු විසින් අමාත්‍ය මණ්ඩලයේ වෙනත් අමාත්‍යවරයකු පත්කළ යුත්තේය" යන වචන ඉවත් කිරීමෙන්;

(උ) (2) වන අනුව්‍යවස්ථාවේ අතුරු විධානය ඉවත් කිරීමෙන්.

9. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 38 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 38 වන ව්‍යවස්ථාවට සංශෝධනය කිරීම

(අ) එම ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඊ) උපඡේදය ඉවත් කිරීමෙන්;

(ආ) එම ව්‍යවස්ථාවේ (2)වන අනුව්‍යවස්ථාවේ (ආ) උපඡේදයේ (i) වන අයිතමයේ "තුනෙන් දෙකකට" යන වචන වෙනුවට "අඩකට" යන වචනය ආදේශ කිරීමෙන් සහ එම අයිතමයේ අවසානයේ "හෝ" වචනය ඉවත් කිරීමෙන්;

(ඇ) එම ව්‍යවස්ථාවේ (2)වන අනු ව්‍යවස්ථාවේ (ආ) උපඡේදයේ (ii) වන අයිතමය ඉවත් කිරීමෙන්;

(ඈ) එම ව්‍යවස්ථාවේ (2)වන අනුව්‍යවස්ථාවේ (ඉ) උපඡේදයේ තුනෙන් දෙකකට" යන වචන වෙනුවට "අඩකට" යන වචනය ආදේශ කිරීම

10. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 39 වන ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 39 වන ව්‍යවස්ථාව ඉවත් කිරීම

11. ආණ්ඩක්‍රම ව්‍යවස්ථාවේ 40 වන ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 40 වන ව්‍යවස්ථාව ඉවත් කිරීම

12. 41 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ අතුරු විධානය වශයෙන් බලපැවැත්විය යුතු පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 වන ව්‍යවස්ථාව මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

"එසේ වුවද, එසේ පත්කරනු ලබන ලේකම්වරුන්ගේ, නිලධරයන්ගේ සහ කාර්ය මණ්ඩලයේ උපරිම ගණන කැබිනට් අමාත්‍ය මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය යුතුය."

13. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

(i) එහි (1) වන ඡේදයේ "ජනාධිපතිවරයා විසින් සභාවට කරන ලද නිර්දේශයක් මත, සභාව විසින් අනුමත කර ඇත්නම් මිස" යන වචන ඉවත් කර ඒ වෙනුවට "සභාවේ නිර්දේශයක් අනුව මිස" යන වචන ආදේශ කිරීමෙන්;

(ii) එහි (1) වන ඡේදයේ අවසානයට "එකී පත්වීම් සඳහා සභාවේ නිර්දේශ ලැබීමේ දින සිට දින දාහතරක් ඇතුළත ජනාධිපතිවරයා විසින් එම තැනැත්තන් පත් කරනු ලැබිය යුතු ය. එකී දින දාහතරක කාලසීමාව ඇතුළත අවශ්‍ය පත්කිරීම් සිදු කිරිමට ජනාධිපතිවරයා අපොහොසත් වන අවස්ථාවක දී, එසේ නිර්දේශ කරනු ලැබූ තැනැත්තන් එම ධූරය සඳහා පත්කර ඇති ලෙස සලකනු ලැබිය යුතුය." යන වචන ආදේශ කිරීමෙන්.

14. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 42 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 42 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

(i) එහි (3) වන ඡේදයේ "ජනාධිපතිවරයා" යන වචන ඉවත් කර ඒ වෙනුවට "අග්‍රාමාත්‍යවරයා" යන වචන ආදේශ කිරීමෙන්;

(ii) එහි (4) වන උපඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අතුරු විධානය එකතු කිරීමෙන් :-

"එසේ වුවද, යම් දේශපාලන පක්ෂයක් විසින් පාර්ලිමේන්තුවේ සම්පූර්ණ ආසන සංඛ්‍යාවෙන් සියයට පනහකට වැඩි ප්‍රමාණයක් ලබාගෙන ඇති අවස්ථාවකදී සහ නාමයෝජනා භාරදෙනු ලබන අවස්ථාවේදී එම පක්ෂය විසින් ස්වකීය අග්‍රාමාත්‍ය ධූර අපේක්ෂකයා නම්කර ඇති අවස්ථාවකදී සහ එම අග්‍රාමාත්‍ය ධූර අපේක්ෂකයා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වන අවස්ථාවකදී, ජනාධිපතිවරයා විසින් එම තැනැත්තා අග්‍රාමාත්‍යවරයා වශයෙන් පත් කරනු ලැබිය යුතුය.

(iii) 42 වන ව්‍යවස්ථාවේ (5) (6) (7) සහ (8) වන ඡේද වශයෙන් බලාත්මක විය යුතු පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන් :-

(5) පාර්ලිමේන්තුව විසින්, එහි පළමු සැසිවාරයේ දී, කථානායකවරයා තේරීමෙන් ඉක්බිතිවම, පාර්ලිමේන්තුව විසින් නීතිය මගින් විධිවිධාන සලස්වා ඇති කාර්ය පටිපාටියට අනුව, අග්‍රාමාත්‍යවරයා වශයෙන් තෝරා පත් කරනු ලබන මන්ත්‍රීවරයා සම්බන්ධ විශ්වාසය පළකිරීමේ ඡන්දයක් විමසනු ලැබිය යුතු ය.

එසේ වුවද, පාර්ලිමේන්තුවට පැමිණ ඡන්දය දෙනු ලබන මන්ත්‍රීවරුන්ගේ බහුතර ඡන්දයෙන් විශ්වාසය පළකිරීමේ ඡන්දය සම්මත කරනු නොලැබුවහොත්, අග්‍රාමාත්‍යවරයා වශයෙන් දැනටමත් පත්කර ඇති මන්ත්‍රීවරයා එම ධුරය දැරීම අවසන් වන අතර පාර්ලිමේන්තුව විසින් නීතිය මගින් නියම කරනු ලබන කාර්ය පටිපාටිය ප්‍රකාරව අග්‍රාමාත්‍යවරයා වශයෙන් ස්වකීය මන්ත්‍රීවරුන් අතරින් එක් අයකු තෝරා පත්කරනු ලැබිය යුතු ය.

එසේම තවදුරටත්, මේ ව්‍යවස්ථාවේ (4) වන උපඡේදයේ අතුරු විධානයේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට අග්‍රාමාත්‍යවරයා පත්කරනු ලැබ ඇත්නම්, එම විශ්වාසය පළ කිරීමේ ඡන්දයක් අවශ්‍ය නොවිය යුතු ය.

(6) මේ ව්‍යවස්ථාවේ (5) වන අනුව්‍යවස්ථාවේ පළමු අතුරු විධානය ප්‍රකාරව අග්‍රාමාත්‍යවරයා වශයෙන් යම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු තේරී පත්වී ඇති අවස්ථාවකදී, එම මන්ත්‍රීවරයා වහාම ජනාධිපතිවරයා ඉදිරියේ දිව්රුම් දිය යුතු අතර එම තේරීමේ දින සිට දින හතක් ඇතුලත ඔහු දිවුරුම්දී නොමැති අවස්ථාවකදී, එම දින හතක කාලසීමාව අවසානයේදී ඔහු අග්‍රාමාත්‍යවරයා වශයෙන් දිවුරුම්දී ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(7) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මීට පටහැණිව කුමක් සඳහන් වුවද, ජනාධිපතිවරයා විසින් පත්කර ඇති හෝ අග්‍රාමාත්‍යවරයා වශයෙන් දිවුරුම්දී ඇති ලෙස සලකනු ලබන අග්‍රාමාත්‍යවරයා, තමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව ධුරය දැරීම අවසන් කරයි නම් මිස, ඉදිරි පාර්ලිමේන්තු මහමැතිවරණය අවසන් වීමෙන් පසුව ජනාධිපතිවරයා විසින් අග්‍රාමාත්‍යවරයකු පත්කරනු ලබන තෙක් ධුරය දරනු ලැබිය යුතු ය.

(8) ජනාධිපතිවරයාට සියලු කැබිනට් අමාත්‍ය මණ්ඩල සංදේශවල හා තීරණ පිළිබඳව දැනුවත් වීමටත් නිවේදන ලබා ගැනීම සඳහා සහ ස්වකීය අදහස් කැබිනට් අමාත්‍ය මණ්ඩලය වෙත සන්නිවේදනය කිරීම සඳහා හිමිකමක් තිබිය යුතුය.

15. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

(1) එහි (1) අනුව්‍යවස්ථාවේ "අග්‍රමාත්‍යවරයාගේ අදහස් විමසීම අවශ්‍ය යයි ජනාධිපතිවරයා සලකන අවස්ථාවන්හි දී, අග්‍රාමාත්‍යවරයාගේ අදහස් ද විමසා" යන වචන ඉවත් කර ඒ වෙනුවට "අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (3) වන ඡේදයේ, "ජනාධිපතිවරයා විසින්" යන වචනවලට ඉක්බිතිවම "අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත" යන වචන එකතු කිරීමෙන්;

(3) එහි (3) වන ඡේදයේ "සංයුතිය" යන වචනය ඉවත් කර ඒ වෙනුවට "අමාත්‍යවරුන්" යන වචනය ආදේශ කිරීමෙන්.

16. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

(1) එහි (2) වන ඡේදයේ "අග්‍රාමාත්‍යවරයාගේ අදහස්

විමසීම අවශ්‍ය යයි ජනාධිපතිවරයා සලකන අවස්ථාවන්හි දී, අග්‍රාමාත්‍යවරයාගේ අදහස් විමසා" යන වචන ඉවත් කර ඒ වෙනුවට "අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (3) වන ඡේදයේ, "ජනාධිපතිවරයා විසින්" යන වචනවලට ඉක්බිතිවම "අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත" යන වචන එකතු කිරීමෙන්.

17. (3අ) අනුව්‍යවස්ථාව වශයෙන් බලාත්මක විය යුතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46 වන ව්‍යවස්ථාවේ (3) වන අනුව්‍යවස්ථාවට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අනුව්‍යවස්ථාව එකතු කිරීමෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46 වන ව්‍යවස්ථාව මෙයින් සංශෝධනය කරනු ලැබේ :- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

"(3අ) කැබිනට් අමාත්‍ය මණ්ඩලයේ යම් අමාත්‍යවරයකුට එරෙහිව, කැබිනට් අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන යම් අමාත්‍යවරයකුට එරෙහිව හෝ යම් නියෝජ්‍ය ආමාත්‍යවරයකුට එරෙහිව පාර්ලිමේන්තුව විසින් විශ්වාසභංග යෝජනාවක් සම්මත කර ඇති අවස්ථාවකදී, එම විශ්වාසභංග යෝජනාව සම්මතවීම සමගම එම අමාත්‍යවරයා ඉල්ලා අස්වී ඇති ලෙස සලකනු ලැබිය යුතු ය."

18. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 48 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 48 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

(අ) එහි (1) වන අනුව්‍යවස්ථාවේ "ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් හෝ ඉල්ලා අස්වීමෙන් හෝ අන්‍යාකාරයකින් හෝ අග්‍රමාත්‍යවරයා ධුරය දැරීම නතරවූ විට" යන වචන ඉවත්කර ඒ වෙනුවට " මියයෑමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ අන්‍යාකාරයකින් හෝ අග්‍රාමාත්‍යවරයා ධුරය දැරීම නතර වූ විට" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) එහි (2) වන අනුව්‍යවස්ථාවේ "අමාත්‍ය මණ්ඩලය විසිරෙන්නේය" යන වචන වලට පෙරාතුවම

"අග්‍රාමාත්‍යවරයා ඉල්ලා අස්වී ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර" යන වචන ඇතුලත් කිරීමෙන්;

(ඇ) (2) වන අනුව්‍යවස්ථාවේ අතුරු විධානය වශයෙන් බලපැවැත්විය යුතු පහත දැක්වෙන ඡේදය ඇතුලත් කිරීමෙන් :-

"එසේ වුවද, මේ ව්‍යවස්ථාවේ කාර්ය සඳහා, පාර්ලිමේන්තුව පළමුව රැස්වූ අවස්ථාවේ සිට පළමු වර්ෂ දෙක කාලය තුලදී, විසර්ජන පනත් කෙටුම්පත තුන්වරක් පාර්ලිමේන්තුවේදී පරාජයට පත්වුවහොත් පමණක් විසර්ජන පනත් කෙටුම්පත ප්‍රතික්ෂේප වී ඇති ලෙස සලකනු ලැබිය යුතුය."

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 50 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

19. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 50 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි (1) වන ඡේදයේ "ජනාධිපතිවරයා" යන වචනයට ඉක්බිතිව ම "අග්‍රමාත්‍යවරයා විසින් දන්වන කැබිනට් අමාත්‍ය මණ්ඩලයේ උපදෙස් මත", යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (2) වන ඡේදයේ, "ජනාධිපතිවරයා" යන වචනය සඳහන් වන සෑම ස්ථානයකින්ම එම වචනය ඉවත් කර ඒ වෙනුවට "අග්‍රාමාත්‍යවරයා" යන වචනය ආදේශ කිරීමෙන්.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 51 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

20. එහි (1) වන ඡේදයේ "ජනාධිපතිවරයා විසින්" යන වචනයට ඉක්බිතිවම "අග්‍රාමාත්‍යවරයා විසින් දන්වා සිටින ආකාරයට, කැබිනට් අමාත්‍ය මණ්ඩලයේ උපදෙස් මත" යන වචන ආදේශ කිරීමෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 51 වන ව්‍යවස්ථාව මෙයින් සංශෝධනය කරනු ලැබේ.

21. එහි (1) වන ඡේදයේ "ජනාධිපතිවරයා විසින්" යන වචනවලට ඉක්බිතිවම "තමා වෙත අග්‍රාමාත්‍යවරයා විසින් දන්වා සිටින ආකාරයට, කැබිනට් අමාත්‍ය මණ්ඩලයේ උපදෙස් අනුව" යන වචන ආදේශ කිරීමෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 52 වන ව්‍යවස්ථාව මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 52 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

22. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 65 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 65 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

(අ) එහි (1) වන අනුව්‍යවස්ථාවේ "මහලේකම්වරයා ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව පත්කරනු ලබන්නේය. මහලේකම්වරයා යථා පැවැත්මෙන් සිටින තාක් ස්වකීය ධුරය දරන්නේය" යන වචන ඉවත් කිරීමෙන්;

(ආ) (5) වන අනුව්‍යවස්ථාවේ (ඇ) අයිතමයේ "ජනාධිපතිවරයා" යන වචනයට පෙරාතුවම "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත" යන වචන එකතු කිරීමෙන්.

23. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

(අ) එහි (1) වන ඡේදයේ "පාර්ලිමේන්තුවේ වාරාවසාන කිරීම" යන වචන ඉවත් කිරීමෙන්;

(ආ) එහි (1) වන ඡේදයේ, "පාර්ලිමේන්තුවේ ප්‍රථම රැස්වීම සඳහා නියම කරනු ලැබූ දිනයෙන් අවුරුදු හතරක් සහ මාස හයකට අඩු නොවන කාලයක් අවසන් වන තෙක්" යන වචන ඉවත් කිරීමෙන්;

(ඇ) එහි (3), (4) සහ (6) වන ඡේද ඉවත් කිරීමෙන්.

24. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 80 වන ව්‍යවස්ථාවේ (2) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන වචන එකතු කිරීමෙන් එම ව්‍යවස්ථාව මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 80 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

"එසේ වුවද, (අ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව අවසන්වීමෙන් පසුව දින දාහතරක කාලයක් ඇතුළත හෝ ජනමත විචාරණයේ වලංගුභාවය අභියෝගයට ලක් කරමින් පෙත්සමක් ගොනු කර ඇති අවස්ථාවක දී, එම ජනමත විචාරණය වලංගු බවට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කිරීමෙන් පසුව දින දාහතරක් ඇතුළත, ජනාධිපතිවරයා පනත් කෙටුම්පත සහතික කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී ඉහත කී දින දාහතරක කාලසීමාව අවසන් වීමෙන් පසුව පනත් කෙටුම්පත සහතික කර ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

25. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 85 වන ව්‍යවස්ථාවේ (1) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන වචන එකතු කිරීමෙන් එම ව්‍යවස්ථාව මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 85 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

"එසේ වුවද, එම පනත් කෙටුම්පතට පක්ෂව (පැමිණ නොසිටින මන්ත්‍රීවරුන් ද ඇතුළුව) පාර්ලිමේන්තුවේ සම්පූර්ණ මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාවෙන් තුනෙන් දෙකක බහුතරයක් පනත් කෙටුම්පත සම්මත කිරීමෙන් පසුව දින 28ක කාලයක් ඇතුළත එවැනි යම් පනත් කෙටුම්පතක් හෝ විධිවිධානයක් ජනමත විචාරණයක් මගින් මහජනතාවට ඉදිරිපත් කිරීමට ජනාධිපතිවරයා අපොහොසත් වන අවස්ථාවක දී, එම පනත් කෙටුම්පත හෝ එහි යම් විධිවිධාන ජනමත විචාරණයක් මගින් මහජනතාව වෙත ඉදිරිපත් කර ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, මැතිවරණ කොමිෂන් සභාව ඒ අනුව ක්‍රියා කරනු ලැබිය යුතුය."

26. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 88 වන ව්‍යවස්ථාවේ "ජනාධිපතිවරයා තෝරා පත් කිරීමේ ඡන්ද විමසීමක දී සහ" යන වචන ඉවත් කිරීමෙන් එම ව්‍යවස්ථාව මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 88 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

27. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

(අ) "ජනාධිපතිවරයා තෝරා පත් කිරීමේ ඡන්ද විමසීමක දී හෝ" යන වචන ඉවත් කිරීමෙන්;

(ආ) එම ව්‍යවස්ථාවේ (ඉ) ඡේදයේ, "හෝ ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ ඡන්ද විමසීම" යන වචන සඳහන් වන සෑම ස්ථානයකින්ම එම වචන ඉවත් කිරීමෙන්;

(ඇ) එම ව්‍යවස්ථාවේ (උ) ඡේදයේ "ජනාධිපතිවරයා තෝරා පත් කිරීමේ ඡන්ද විමසීම හෝ" යන වචන සඳහන් වන සෑම ස්ථානයකින්ම එම වචන ඉවත් කිරීමෙන්.

28. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 92 වන ව්‍යවස්ථාවේ (ඇ) උපඡේදය ආරම්භයේ ඇති "ඔහු ජනතාව විසින්" යන වචන වෙනුවට "ඔහු ජනතාව විසින් සහ/හෝ පාර්ලිමේන්තුව විසින්" යන වචන ආදේශ කිරීමෙන් එම ව්‍යවස්ථාව මෙයින් සංශෝධනය කරනු ලැබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 92 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

29. "ජනරජයේ ජනාධිපතිවරයා සහ" යන වචන ඉවත් කිරීමෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 93 වන ව්‍යවස්ථාව මෙයින් සංශෝධනය කරනු ලැබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 93 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

30. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 94 වන ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලැබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 94 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

31. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99 වන ව්‍යවස්ථාව අවසානයට පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් එම ව්‍යවස්ථාව මෙයින් සංශෝධනය කරනු ලැබේ :- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

(14) මේ ව්‍යවස්ථාවේ (13) වන ඡේදයේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට මිස, පාර්ලිමේන්තු

මන්ත්‍රීවරයකු වන්නා වූ යම් සාමාජිකයකුට එරෙහිව යම් පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් ගන්නා ලද හෝ ගනු ලැබීමට යෝජිත යම් විනය ක්‍රියාමාර්ගයකට අදාළ කරුණක් විභාගකර නිශ්චය කිරීම සඳහා කිසිදු අධිකරණයකට අධිකරණ බලය නොතිබිය යුතු අතර ඒ අනුව එම ක්‍රියාව හෝ යෝජිත ක්‍රියාව වලක්වමින්, ඒ සඳහා බාධාකරමින් හෝ තහනම් කරමින් රිට් ආඥාවක් ඉන්ජන්ක්ෂන් තහනමක්, වාරණ නියෝගයක් හෝ වෙනත් යම් සහනයක් ප්‍රදානය කිරීමට කිසිදු අධිකරණයකට බලය නොතිබිය යුතු ය.”

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඇ වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

32. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඇ ව්‍යවස්ථාවේ 2 වන ඡේදයේ “හෝ ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ ඡන්ද විමසීමක දී” යන වචන ඉවත් කිරීමෙන් එම ව්‍යවස්ථාව මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 129 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

33. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 129 වන ව්‍යවස්ථාවේ (1) සහ (4) වන ඡේද මෙයින් ඉවත් කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 130 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

34. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 130 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(1) එහි (අ) ඡේදයේ “ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම හෝ” යන වචන ඉවත් කිරීමෙන්ත

(ආ) එහි අතුරු විධානයේ “ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම හෝ” යන වචන ඉවත් කිරීමෙන්.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

35. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(අ) එහි (1) වන අනුව්‍යවස්ථාවේ “අතර, ජනාධිපතිවරයා විසින් ව්‍යවස්ථාදායක සභාවේ අනුමතයට යටත්ව පත්කරනු ලබන්නේය. විගණකාධිපතිවරයා යථා පැවැත්මෙන් සිටින තාක් ස්වකීය ධූරය දරන්නේ.” යන වචන ඉවත් කිරීමෙන්;

(ආ) එහි (3) වන අනුව්‍යවස්ථාවේ (ඇ) අයිතමයේ “ජනාධිපතිවරයා” යන වචනයට පෙරාතුව “ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශය මත” යන වචන එකතු කිරීමෙන්.

36. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

(අ) එහි (2) වන අනුව්‍යවස්ථාව ඉවත් කිරීමෙන්;

(ආ) (4) වන අනුව්‍යවස්ථාවේ (ඇ) අයිතමයේ “ජනාධිපතිවරයා” යන වචනයට පෙරාතුවම “ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශය මත” යන වචන එකතු කිරීමෙන්.

37. සැකදුරු කිරීමේ කාර්ය සඳහා පහත දැක්වෙන පරිදි මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ :- අන්තර්කාලීන විධිවිධාන

(අ) මේ පනත බලාත්මක වන දිනයට පෙරාතුව වූ දිනයේ පැවති අටවන පාර්ලිමේන්තුව කලින් විසුරුවා හරිනු ලැබුවහොත් මිස 2020 පෙබරවාරි 08 දිනය දක්වා අඛණ්ඩව ක්‍රියාත්මක විය යුතු අතර ඉන්පසුව විසුරුවා හරිනු ලැබිය යුතු වේ;

(ආ) මේ පනත බලාත්මක වන දිනයේ ජනාධිපතිවරයා වශයෙන් ධූරය දරනු ලබන තැනැත්තා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව 2020 ජනවාරි 8 වන දිනය තෙක් එම ධූරය අඛණ්ඩව දැරිය යුතු වේ;

(ඇ) මේ පනත බලාත්මක වන දිනයේදී අග්‍රාමාත්‍යවරයා වශයෙන් ධුරය දරනු ලබන තැනැත්තා එම දිනයෙන් පසුව, තත්කාලයේ බලපවත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, නව වන පාර්ලිමේන්තුව තෝරා පත් කිරීම සඳහා වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තෝරා පත් කිරීමේ මැතිවරණය අවසන් වන තෙක් එම ධුරය අඛණ්ඩව දැරිය යුතු වේ;

(ඈ) මේ පනතේ විධිවිධාන 2020 ජනවාරි 9 වන දිනයේ දී බලාත්මක විය යුත්තේ ය.